# ජන අරගල ව්‍යාපාරය
# மக்கள் போராட்ட இயக்கம்
# Movement for People’s Struggle

22/1, Melder Place, Nugegoda Tel: 076 2717 231 Email: writetopsm@gmail.com


මන්ත්‍රීතුමියනි, මන්ත්‍රීතුමනි,

## ඩිජිටල් හැඳුනුම්පතට අදාළ ඉන්දියානු මැදිහත්වීම

පසුගිය මාසයේ, එනම් 2024 දෙසැම්බර් 22 දින Sunday Times පුවත්පතේ ප්‍රධාන සිරස්තලය පිළිබඳව ඔබගේ කඩිනම් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිමු. එම පුවත්පතට අමාත්‍ය විජිත හේරත් පවසා ඇත්තේ ජනාධිපතිවරයාගේ ඉන්දියානු සංචාරය අතරතුර එළඹුණු ගිවිසුමකට අනුව ලංකාවේ පුරවැසියන්ට ඩිජිටල් හැඳුනුම්පත් නිකුත් කිරීමේ බලය ඉන්දියානු සමාගමකට ලබාදෙන බවයි. ඊට අදාළ අවබෝධතා ගිවිසුම ජනවාරි මාසයේ අත්සන් කරන බවද ඔහු පවසා තිබේ. මෙය ලංකාවේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සම්බන්ධයෙන් මෙන්ම ජාතික ආරක්ෂාව, මහජන ආරක්ෂාව සහ රටේ ආර්ථික - දේශපාලන ස්වාධිපත්‍යය පිළිබඳවද බරපතල අවදානමක් බව අපි අවධාරණයෙන් කියා සිටිමු. ඩිජිටල් හැඳුනුම්පත පිළිබඳ කටයුතු ඉන්දියානු සමාගමකට ලබාදීම සම්බන්ධයෙන් වන ඉතිහාසය පළමුව විමසා බැලීම වැදගත් වේ.

මේ වනවිට භාවිතා වන ජාතික හැඳුනුම්පතේ ඇත්තේ අපේ නම, ලිපිනය, උපන්දිනය, උපන් ස්ථානය වැනි ජීව දත්ත (Bio - Data) සමූහයකි. මේ වෙනුවට ජනතාවගේ ජෛවමිතික ලක්ෂණ (Biometrics) ඇතුළත් හැඳුනුම්පත් නිකුත් කිරීමට 2015දී යහපාලන ආණ්ඩුව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතට සංශෝධනයක් සිදු කළේය. ඒ නව නීතියට අනුව ජනතාවගේ ඇඟිලි සලකුණු, මුහුණේ දත්ත, ඇස් වල අනන්‍යතා ලක්ෂණ වැනි ජෛවමිතික ලක්ෂණ ලබාගෙන ගබඩා කිරීමට රජයට අයිතියක් ලැබේ. මෙය ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සම්බන්ධ ප්‍රශ්නයකි. 1756 ඇමරිකානු විප්ලවය විසින් ගෙනඑනු ලැබූ නිදහසේ ප්‍රකාශනය සහ 1789 ප්‍රංශ විප්ලවය විසින් ගෙනඑනු ලැබූ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය මගින් පුරවැසියාගේ ශාරීරික ලක්ෂණ රාජ්‍යය සතු කර ගැනීම සම්බන්ධ සීමාවන් මුලින්ම පැනවිණි. වැඩවසම් සමාජ ක්‍රමය පැවතුනු කාලයේ රජය ගැන තිබුණේ දේවවරම්වාදය වන අතර එයට අනුව රජයට බලය ලැබෙන්නේ දෙවියන්ගෙන් නිසා පුරවැසියාගේ ශරීරයට රජයට මැදිහත් විය හැක.  නමුත් නව සමාජ ක්‍රමයක් ආරම්භයත් සමග වර්ධනය වුනු ලිබරල් අදහස් වල තිබුණේ සමාජ සම්මුතිවාදයකි. එයට අනුව රජය යනු සමාජය විසින් ඇති කර ගන්නා සම්මුතියක් නිසා රජයට පුරවැසියාගේ ශරීරයට අත තැබිය නොහැක. ඒ අනුව බලන කල ජෛවමිතික ලක්ෂණ පුද්ගලගේ පෞද්ගලිකත්වය පිළිබඳ සාධකයක් ලෙස සැලකීම ආරම්භ වී සහ එහි අයිතිය පොදුවේ පිළිගෙන සියවස් දෙකහමාරකටත් වඩා අධික කාලයක් ගෙවී ගොස් තිබේ. ලංකාවේ නීතිය සකස් කර ඇත්තේත් එම පදනම මතය. ඒ නිසා රජයට පුද්ගලයෙකුගේ ජීව දත්ත ගත හැකි වුවත් ශරීරයට අදාළ ජෛවමිතික ලක්ෂණ ගත නොහැක. ඒ සඳහා විශේෂ අධිකරණ නියෝග අවශ්‍ය වේ. 2015දී යහපාලන ආණ්ඩුව අවුරුදු

250ක් තිබුණු පුරවැසියාගේ ශරීරය සඳහා වන අයිතිය උදුරා ගනිද්දී පාර්ලිමේන්තුවේ එයට එරෙහිව තිබුණේ එක ඡන්දයක් පමණකි. එය එක්තරා ආකාරයකට ලංකාවේ පාර්ලිමේන්තුව ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් පිළිබඳව දක්වන ආකල්පය පිළිබඳ සංඥාවකි.

ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් පිළිබඳ ප්‍රශ්නය ජෛවමිතික ලක්ෂණ රජය සතු කර ගැනීමට පමණක් සීමා නොවේ. ඩිජිටල් හැඳුනුම්පතට අදාලව නිර්මාණය කරන දත්ත ගබඩාව පුරවැසියන්ගේ සියලු දත්ත වල ඒකාබද්ධතාවයක් ගොඩ නගයි. වත්මන් නීතිමය පදනමට අනුවද පුරවැසියා පිළිබඳ තොරතුරු එක් එක් රාජ්‍ය ආයතන වලින් ලබා ගනුයේ එම ආයතනයේ නිශ්චිත අවශ්‍යතා මත පමණක් පදනම් වෙමිනි. නිදසුනක් ලෙස ග්‍රාම නිලධාරීවරයා සතුව අදාළ ප්‍රදේශයේ ජනතාවගේ පවුල් සහ නිවෙස් වල පදිංචිකරුවන් පිළිබඳ තොරතුරු තිබෙන අතර සෞඛ්‍ය අමාත්‍යාංශය සතුව රජයේ රෝහල් වල සායන දත්ත ආදී පුද්ගල සෞඛ්‍ය පිළිබඳ තොරතුරු ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සතුව පුද්ගලයන්ගේ වත්කම් - බැරකම් තොරතුරු තිබෙන අතර බැංකු සතුව පුද්ගලයන් සතු ගිණුම් පිළිබඳ සහ ණය පිළිබඳ තොරතුරු ඇත. එම දත්ත එකිනෙකින් වෙනස් ආයතන සතුවන අතර එක් ආයතනයකට වෙනත් ආයතනයක් සතුව පවතින තොරතුරු ලබා ගැනීමට අවශ්‍යනම් ඒ සඳහා අදාළ පුද්ගලයාගේ අනුමැතිය හෝ අධිකරණ අනුමැතියක් අවශ්‍ය වේ. පුරවැසියන් සතු සියලු තොරතුරු එක තැනකට ඒකාබද්ධ කර, ඒවා පවුල් ගස් ආකාරයෙන් එකිනෙක හා සම්බන්ධ කර රාජ්‍යය සතු කර ගැනීම මෙතෙක් එම ක්ෂේත්‍රයට අදාළව පිළිගෙන තිබුණු ජනතා අයිතිවාසිකම් උඩුයටිකුරු කිරීමකි. එමෙන්ම එම තොරතුරු අන්සතු වීමේ සහ එමගින් පුද්ගලයන් අනතුරු වලට ලක්වීමේ සම්භාවිතාවද ඉතා අධිකය. විශේෂයෙන් එම තොරතුරු වෙළඳපල සහ සමාගම් සතුවීමෙන් සිදුවන ප්‍රශ්න ඉතාම බරපතලය.

ඩිජිටල් හැඳුනුම්පතේ ප්‍රශ්නය ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්නයක මට්ටමේ සිට අද වනවිට ජාතික ආරක්ෂාව, මහජන ආරක්ෂාව, ලංකාවේ ස්වෛරීත්වය පිළිබඳ ප්‍රශ්නයක් බවට පත් වී තිබේ. දැන් හැඳුනුම්පත් ටෙන්ඩරයක මුවාවෙන් ඉන්දියාව ලංකාවේ ජනතාවගේ ජෛවමිතික ලක්ෂණ සියල්ල අත්පත් කර ගැනීමට උත්සාහ දරයි. මෙය ආරම්භ වුයේ ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුව 2021 ජුලි මාසයේ නව ඩිජිටල් ජාතික හැඳුනුම්පත සැකසීම සඳහා ප්‍රසම්පාදන පිරිවිතරයන් සකස් කිරීමත් සමගිනි. ඉන් අනතුරුව 2022 ජනවාරි 28 වැනිදා ඉන්දියානු සමාගමකින් නව ඩිජිටල් හැඳුනුම්පතක් සකස් කිරීමට ගෝඨාභය රාජපක්ෂගේ අත්සනින් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර සම්මත කර ගැනීමත් සමග ඉන්දියාවට මේ අවකාශය විවෘත විය. ඉන් අනතුරුව 2023 මැයි 8 වැනිදා රනිල් - රාජපක්ෂ ආණ්ඩුව ඒ සඳහා ටෙන්ඩර් කැඳවීමක් කළ අතර මෙම ටෙන්ඩරයට ඉල්ලුම් කළ හැක්කේ ඉන්දියානු සමාගම් වලට පමණයි යනුවෙන් කොන්දේසියක්ද එහි විය. මේ සමස්ත ව්‍යාපෘතිය සඳහා ලංකා රුපියල් බිලියන 41.09ක් වැය වන අතර එයින් ලංකා රුපියල් බිලියන 22.33ක් ඉන්දියාවෙන් ලබා දීමට පොරොන්දු වී සිටියේය. ලංකාවේම ජනතාවගේ දත්ත අත්පත් කර ගැනීමට ඉන්දියාව වැය කරන්නේ ඉතා සුළු මුදලකි. මේ ටෙන්ඩරය සඳහා 2023දී ලංසු ඉදිරිපත් කළේ ඉන්දියානු සමාගම් දෙකක් පමණි. ඒ 'මැඩ්‍රාස් සෙකියුරිටි ප්‍රින්ටර්ස්' සමාගම සහ 'ප්‍රෝටීන් ටෙක්නොලොජීස්' සමාගමයි. ඒ අතරිනුත් ඉතාම වැරදි ක්‍රියා සඳහා අසාදු ලේඛනගත වී සිටින 'මැඩ්‍රාස් සෙකියුරිටි ප්‍රින්ටර්ස්' සමාගමට ටෙන්ඩරය ලබා දීමට යද්දී පැනනැගුණු විරෝධතා නිසා ටෙන්ඩරය අවලංගු කෙරිණි. ඉන්පසුව රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව උත්සාහ කළේ නැවත අලුතෙන් ටෙන්ඩර් කැඳවා වෙනත් ඉන්දියානු සමාගමක් තෝරාගෙන  දත්ත ලබා ගැනීමේ බලය ඉන්දියාවටම ලබා දීමටය. නමුත් පැමිණි ජනතා විරෝධය හමුවේ එය සාර්ථක නොවීය.

නමුත් ඉන්දියාව මේ සම්බන්ධයෙන් කරන බලපෑම අවසන් නොවන බව අනාවරණය වුයේ 2024 පෙබරවාරි පළමුවැනිදා  ලංකාවේ පවතින ජාතික හැඳුනුම්පත වෙනුවට ජෛවමිතික ලක්ෂණ රැගත් ඉලෙක්ට්‍රොනික හැඳුනුම්පතක් නිකුත් කිරීමේ ටෙන්ඩරය ලබා ගැනීමට ඉන්දියානු සමාග

මක් සමත් වන බව ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස් සන්තෝෂ් ජා පැවසීමත් සමගයී පසුගිය වර කැඳවූ ටෙන්ඩරයේ ප්‍රශ්න තිබුණත් මේ වසරේ මැද වනවිට යමක් සිදුවනු ඇති බවද ඔහු පවසා තිබිණී ලංකාවේ ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සහ ඒවාට අදාළ රජයේ ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් ඉන්දියානු මහ කොමසාරිස්වරයා මෙවැනි ප්‍රකාශ කරන්නේ කෙසේද□ ටෙන්ඩර් කැඳවීමේ කාල වකවානු සහ ටෙන්ඩරය ලබා දෙන්නේ කාහටද යන්න තීරණය කරන්නේ ඉන්දියාවද යන ප්‍රශ්න මෙහිදී මතුවේ මෙම නිදසුන්වලින්ද පෙනී යන්නේ සොච්චම් මුදලක් වැය කරමින් ලංකාවේම ජනතාවගේ දත්ත තමන් සතු කර ගැනීමට ඉන්දියාව විශාල බලපෑමක් කරමින් සිටින බවයී වත්මන් ආණ්ඩුවද ඩිජිටල් හැඳුනුම්පත් නිකුත් කිරීමට අදාල බලය ඉන්දියානු සමාග මකට ලබාදීමට තීරණය කරන්නේ එම බලපෑමට හසුවීමේ ප්‍රතිඵලයක් ලෙස බව පැහැදිලියී එම සමාගම කුමක්ද□ එය තෝරා ගත්තේ කුමන ක්‍රියාවලියක් ඔස්සේද යන්න පවා ආණ්ඩුව පැහැදිලි කර නැතී

ලෝකයේ කිසිම රටක් මේ ආකාරයට තමන්ගේ රටේ ජනතාවගේ දත්ත විදෙස් රටක් සතු කර නැතී අපි ජීවත් වන යුගයේ රටවල් යටත්කිරීමට හා මෙල්ල කිරීමට භාවිතා වන ප්‍රධාන අවි අතර තොරතුරු සහ දත්තද තිබෙන බව පැහැදිලියී අප ජීවත් වන්නේ තොරතුරු යුගයක වන අතර ජනතාවගේ තොරතුරු හා දත්ත විදෙස් රටක් සතුවීම අතිවිශාල අවදානමකී රටක ජනතාවගේ තොරතුරු වෙනත් රටක් විසින් අත්පත් කර ගැනීම මගින් පමණක් පවා ඒ රට යටත් භාවයට පත්කළ හැකී ඉන්දියාව අද ඒ උපායමාර්ගික මැදිහත්වීම ලංකාවට සිදු කරමින් සිටී

ඒ හමුවේ ලංකාවේ ජනතාවගේ මහජන ආරක්ෂාව බරපතළ අවදානමකට ලක්ව ඇතී එබැවින් මෙම තත්වය මැනවින් සලකා බලා□ අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන් ලෙස ඔබව තෝරා පත්කළ ජනතාව වෙනුවෙන් පෙනී සිටීමේ වගකීමක් ඔබට තිබේ ඩිජිටල් හැඳුනුම්පත් සම්බන්ධ කටයුතු ඉන්දියානු සමාගමකට පැවරීමේ තීරණය වහාම අවලංගු කිරීමේ යෝජනාවක් පාර්ලිමේන්තුවට ගෙන එන ලෙසද□ නව තාක්ෂණ වර්ධනයන්ගේ ප්‍රතිලාභ අත්පත් කර ගන්නා අතරම ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම් ආරක්ෂා කරන නව හැඳුනුම්පත් ව්‍යාපෘතියක් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අනුමත කර ගන්නා ලෙසද ඔබට යෝජනා කරමූ මෙම විෂයයේදී ඔබගේ දේශපාලන ප්‍රවේශය ඔබ පාර්ලිමේන්තුවට පත්කළ ජනතාවගේ අභිලාෂයන් සහ අයිතීන් නියෝජනය කිරීම පිළිබඳවද□ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පාර්ලිමේන්තුවට පවරා ඇති ජනතා පරමාධිපත්‍ය බලය භාවිතා කරන ආකාරය පිළිබඳවද ඔබගේ ස්ථාවරය සමාජයට අනාවරණය වන අවස්ථාවක් බවද ඔබට සිහිපත් කර සිටිමූ

වසන්ත මුදලිගේ
ජාතික විධායක සභික
ජන අරගල ව්‍යාපාරය
2025 ජනවාරි 06